# සාමාන්‍ය සමයේ දහසත්වන සතිය
# සඳුදා

## පළමුවන කියැවීම

නික්මයාම පොතෙන් ගත් පාඨයෙකි.

නික්මයාම 32: 15–24, 30–34

**“ඔව්හු රන් දේව රූප සාදා මහත් සේ පව් කළහ.”**

මෝසෙස් හැරී කන්දෙන් බැස එන විට සාක්ෂි ගල් පුවරු දෙක තම අතේ විය. ගල් පුවරු දෙකේ එක පැත්තක මෙන්ම අනික් පැත්තේ ද ලියා තිබිණි. ඒ ගල් පුවරු දෙවියන් වහන්සේගේ නිර්මාණයක් විය. ඒවායේ කෙටූ ලියවිල්ල ද දෙවියන් වහන්සේගේ ම ලියවිල්ල විය. සෙනඟගේ ඝෝෂාව ජෝෂුවාට ඇසුණු විට ඔහු මෝසෙස් අමතා, “කඳවුරේ යුද්ධ ඝෝෂාවෙකි”යි කීවේය. එහෙත් මෝසෙස් පිළිතුරු දෙමින් මෙසේ කීවේ ය.

“මට ඇසෙන ඒ හඬ, ජය ගොසක් නොම වේ.
පැරදුම් හඬක් ද නොම වේ.
එය ගී ගැයුමක් පමණක් වේ.”

ඔහු ද මෙසේ කියමින් කඳවුරට ළඟා වූ විට වස්සා ද සෙනඟගේ නැටුම් ද දිටීය. ඔහුගේ කෝපාග්නිය ද එවිට වේගවත්ව ඇවිළී ගියෙන් ඔහු තම අත වූ ගල් පුවරු වීසි කොට, ඒවා කන්ද පාමුල බිඳ දැමීය. පසුව ඔහු ඔවුන් සෑදූ වස්සා ගෙන, ගින්නෙන් පුළුස්සා කුඩු කුඩු කොට, එය ජලය මත ඉස, ඒ ජලය ඉශ්රායෙල් ජනයාට බොන්නට සැලැස්වීය. මෝසෙස් ද ආරොන් අමතමින් “මේ සෙනඟ ලවා මේ සා මහත් පාපයක් කරවීමට

ඔවුන් ඔබට කුමක් කළේ දැ''යි විචාළේය. ආරොන් පිළිතුරු දෙමින් ''මාගේ ස්වාමින්ගේ උදහස වේගවත් ව නොඇවිළේවා! මේ සෙනඟ නපුරට කෙතරම් බර වී සිටින්නෝ දැ යි ඔබ දන්නෙහි ය. ඔව්හු මට කතා කොට, ''අපට පෙරටුව යෑමට දෙවියෙකු අපට සාදා දෙන්න. මිසර දේශයෙන් අප පිටතට ගෙනා ඒ මෝසෙස් නම් මිනිසාට කුමක් වූයේ දැ යි අපි නොදනිමු''යි කීහ. මම ඔවුන්ට පිළිතුරු දෙමින්, රන් බඩු යමක් ඇත්තේ දැ යි ඇසූ විට ඔව්හු ද ඒවා ගලවා මට දුන්හ. මම ඒවා ගින්නට විසි කළෙමි. එවිට මේ වස්සා නික්ම ආයේ ය''යි කීය.

පසුදින මෝසෙස් සෙනඟ අමතමින්, ''ඔබ දරුණු පාප අපරාධයක් කළහු ය. දැන් මම සමිඳාණන් වහන්සේ වෙත කන්දට නගිමි. ඇතැම් විට ඔබට පව් සමාව ලබා දෙන්නට මට හැකි වන්නේ ය''යි කීය. ඔහු ද සමිඳාණන් වහන්සේ වෙත ආපසු ගොස් ''අහෝ මේ සෙනඟ දරුණු අපරාධයක් කළෝය. ඔව්හු ඔවුන්ටම රනින් දෙවියෙකු සාදා ගත්හ. දැන් ඉතින් ඔවුන්ගේ පාපයට කමාව දුන මැනව. එසේ නොදෙන සේක් නම්, කරුණාකර ඔබ වහන්සේගේ පොතෙන් මාගේ නාමය මකා දැමුව මැනව''යි ඉල්ලීය. සමිඳාණන් වහන්සේ ද මෝසෙස් අමතමින් ''මට විරුද්ධව යමෙක් පව් කළේ ද ඔහුගේ නම මාගේ පොතින් මම මකා දමමි. එබැවින් දැන් යන්න. මා නුඹට කී ස්ථානයට සෙනඟ ගෙන යන්න. බලන්න මාගේ දූතයා ද නුඹට පෙරටුව යනු ඇත. එහෙත් මම දඬුවම් දෙන දවසේ දී, ඔවුන්ගේ පාපයට දඬුවම් දෙමි''යි වදාළ සේක.

දේව වාක්‍යය එසේය.

# පිළිතුරු ගීය

ගීතාවලිය 106: 19 – 23

පිළිතුර: සමිඳුන්ට තුති පුදන්න. එතුමාණෝ යහපත් ය.

ගීය:

ඔව්හු හෝරේබ් කන්දෙහි වස්සෙකු සාදා වාත්තු රූපයකට නමස්කාර කළෝය. මෙසේ ඔව්හු දෙවියන්ගේ නාමය තණ බුදින ගවයෙකුගේ ස්වරූපයට වෙනස් කළෝය. මිසරයේ දී බලවත් ක්‍රියා කර, ඔවුන් ගළවා ගත් දෙවිඳුන් ඔව්හු අමතක කළෝය.

එතුමාණෝ ඒ දේශයේ දී අරුම පුදුම ක්‍රියා ද රතු මුහුද ළඟ බියකරු ක්‍රියා ද කළ තැනැත් වහන්සේ නොවන සේක් ද? එබැවින් එතුමාණෝ ඔවුන් විනාශ කරන බව වදාළ සේක.

එහෙත්, එතුමාණන් ඔවුන් විනාශ නොකරන ලෙස, දේව උදහස පහ කරන පිණිස, එතුමාණන් තෝරාගත් මෝසෙස් එතුමාණන් ඉදිරියේ මැදිහත් වූයේ ය. දේව කෝපයෙන් ඔවුන් විනාශ කිරීම වැළැක්විය.

# සාධුකාරය (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ මහිමයට ඔබ පංගුකාරයන් වන පිණිස සුබ අස්න මගින් දෙවියන් වහන්සේ ඔබ කැඳවූ සේක.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
දෙවියන් වහන්සේ මැවූ සත්ත්වයන් අතර අප මුදුන් මල්කඩ වීමේ පෙර ලකුණු වශයෙන්
සිය අරමුණ අනුව උන්වහන්සේ සත්‍ය වචනයෙන් අප ජනිත කළ සේක.
ආලේලූයා!

## සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 13: 31-35

**"අහසේ කුරුල්ලන් අවුත් එහි අතුවල ලැගුම් ගන්න තරම් ලොකු ගසක් වන්නේය."**

ජේසුස් වහන්සේ ඔවුන් ඉදිරියෙහි තවත් උපමාවක් වදාරමින් "ස්වර්ග රාජ්‍යය මෙබඳුය. එක්තරා මිනිසෙක් සිය කෙතෙහි අබ ඇටයක් වපුළේ ය. එය සියලුම බීජවලට වඩා කුඩා වුවත්, වැඩුණු කළ හැම පලා වර්ගවලට වඩා විශාල වී, අහසේ කුරුල්ලන් අවුත් එහි අතුවල ලැගුම් ගන්න තරම් ලොකු ගසක් වන්නේ ය"යි වදාළ සේක.

උන්වහන්සේ තවත් උපමාවක් ගෙන හැර දක්වමින් "ස්ත්‍රියක විසින් පිටි නැළි තුනක් සහමුලින්ම පිපෙන තුරු එහි දමන ලද මුහුන් පිඩකට ස්වර්ග රාජ්‍යය සමාන ය"යි වදාළ සේක.

ජේසුස් වහන්සේ මේ සියල්ල ජනකායට උපමා මගින් පැවසූ සේක. උපමාවක් නැති කිසිවක් ඔවුන්ට නොවදාළ සේක. මෙසේ වූයේ "මම උපමා මගින් කතා කරමි. ලෝකයේ මුල සිටම රහස්ව තිබුණු දේ හෙළි කරන්නෙමි"යි දිවැසිවරයන් ලවා පවසන ලද කරුණු ඉටුවන පිණිස ය.

සුවිශේෂ වාක්‍යය එසේය.